(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 32.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 සැප්තැම්බර් මස 07 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0006/'10

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) ගොවිජන කේන්ද්‍ර මට්ටමින් සිටින්නා වූ අද ගොවියන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අද ගොවියන්ගේ ලිපිනයන් ඇතුළු නාම ලේඛනයක් ගොවිජන කේන්ද්‍ර මට්ටමින් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0036/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කිරිබත්ගොඩ, නුගේගොඩ, දෙහිවල, කඩවත, කොට්ටාව සහ ඔරුගොඩවත්ත යන ප්‍රදේශවල ඉදිකරන ලද එක් එක් ගුවන් පාලමෙහි,

(i) ඉදිකිරීම් පිරිවැය;

(ii) දිග හා වර්ගඵලය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුවන් පාලම් සාමාන්‍ය සිමෙන්ති යොදා කරන ඉදිකිරීමක් ලෙස ඉදිකරන ලද්දේ නම්, එම එක් එක් ගුවන් පාලම සඳහා වැය වන ඉදිකිරීම් පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ඉදිකිරීම්වලට අදාළව ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) ටෙන්ඩර් කැඳවා තිබේ නම්, ලැබී ඇති තරඟකාරී මිල ගණන් කවරේද;

(iii) මෙම ඉදිකිරීම් සඳහා අරමුදල් ලැබුණු මූලාශ්‍ර කවරේද;

(iv) ඒ සඳහා වැය වූ සමස්ත පිරිවැය සහ එම ණය මුදලට ගෙවිය යුතු පොලිය කවරේද;

(v) එකී ණය මුදල ආපසු ගෙවිය යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0051/'10

3.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගෘහස්ත හිංසන පනත යටතේ ලබාදුන් අතුරු නියෝග, අවසන් නියෝග බවට පත්කරන තුරු හෝ ඉවත් කරන තුරු වලංගුව පැවතිය හැකි උපරිම කාලසීමාව කොපමණද;

(ii) මෙම අවශ්‍යතාව නොසලකා හැර සිටීමට නීතියට අනුව ඉඩකඩ තිබේද;

(iii) මෙම අවශ්‍යතාවයට අනුව කටයුතු නොකළ අවස්ථා පසුගිය වසර දෙකක කාලය තුළ ඇතිවී තිබේද;

(iv) එවැනි අවස්ථා ඇතිවී තිබේ නම්, ඒ සඳහා යොදා ගත හැකි පිළියම් කවරේද;

(v) මෙම නීතියට වඩා හොඳින් අනුගතවීම ප්‍රවර්ධනය කිරීම සඳහා මේ ක්‍රියාදාමයට සම්බන්ධ වන ඕනෑම අධිකරණ නිලධාරීන් පිරිසක් සඳහා අවශ්‍යවන පුහුණු වැඩසටහන් පැවැත්වීමට අදාළ පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0120/'10

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාවේ ඖෂධ හිඟයක් ඇතිවී තිබෙන බවට 2010 මැයි මාසයේදී පළ වූ මාධ්‍ය වාර්තා එතුමා පිළිගන්නෙහිද?

(ආ) එම ඖෂධ හිඟයට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඖෂධ වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් තරමින් තොග ගබඩාවල තිබිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් නිපදවන ඖෂධ වර්ග ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට පිටරටින් ගෙන්වන ඖෂධ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ලබා ඇති පාඩුව හෝ ණය වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0267/'10

5.

ගරු කමලා රණතුංග මෙනෙවිය,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වසර 20ක් ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ, ජාතික බලශක්ති අර්බුදයට විසඳුමක් වූ, නොරොච්චෝලේ විදුලි බලාගාරයේ ඉදිකිරීම් ආරම්භ කළ දිනය කවරේද;

(ii) එයින් නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන මෙගා වොට් ප්‍රමාණය කොපමණ ද;

(iii) මෙම ඉදිකිරීම සඳහා වැයවන සම්පූර්ණ මුදල කොපමණ ද;

(iv) මෙම බලාගාරයේ ඉදිකිරීම් ප්‍රමාද කිරීම හරහා රටට සිදු වූ පාඩුව කොපමණද;

(v) එම කටයුතු ප්‍රමාද කිරීමට කටයුතු කළ අයට විරුද්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0305/'10

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපතිධුරය යම් පුද්ගලයෙකුට හෙබවිය හැකි වාර ගණන කොපමණද;

(ii) එම වාර ගණන වැඩි කිරීම සඳහා රජය කටයුතු කිරීමට අදහසක් තිබේද;

(iii) එසේ නම්, ඒ කී වරක් දක්වාද;

(iv) එසේ වාර ගණන වැඩි නොකරන්නේ නම්, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට රජය අදහස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0346/10

7.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල නගර සභා බල ප්‍රදේශයේ පිහිටි පැල්පත් නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පැල්පත් නිවසේ හිමිකරුගේ / පදිංචි පවුලේ ප්‍රධානියාගේ නම සහ ලිපිනය කවරේද;

(iii) ඉහත නිවාසයන් හි පදිංචි අනුපවුල්වල ප්‍රධානීන්ගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එක් එක් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0037/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අප රටේ ධීවරයින් විශාල සංඛ්‍යාවක් විදේශ රටවල අත්අඩංගුවේ පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2005 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගනු ලැබූ ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට විදේශ රටවල අත්අඩංගුවේ පසුවන ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0068/'10

9\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගහවල, බිංකම, මැදආර ග්‍රාම නිලධාරි වසමේ, කරගහවල, මැදආර, හිංආර මාර්ගයේ කි.මී. 05 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන් තත්වයක ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0272/'10

10\.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අධ්‍යාපන විද්‍යාපීඨ සහ අනිකුත් ගුරු පුහුණු ආයතනයන්හි අධ්‍යයන කාර්ය මණ්ඩලවල තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මානව හිමිකම් පිළිබඳ ජාතික කොමිෂන් සභාව වෙත ඉදිරිපත්කර ඇති පැමිණිලි කවරේද;

(ii) එවැනි පැමිණිලි සම්බන්ධයෙන් මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙතින් ලැබී ඇති තීන්දු කවරේද;

(iii) ඉහත කී තීන්දු ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එවැනි තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට පළ කරන ලද වෙළඳ දැන්වීම්වල සඳහන් වයස පිළිබඳ නියමයන් සම්බන්ධයෙන් පැවැති විෂමතාවන් කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් වන මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභා තීරණ ක්‍රියාත්මක කරන බවට සහතිකවීමට සහ බඳවාගැනීම් නියමයන් සම්බන්ධයෙන් කිසියම් විෂමතාවන් ඇත්නම්, ඒවා නිවැරදි කිරීමට එතුමා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/10

11\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2006 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාව පෙන්වා දෙන පරිදි,

(i) මීටර් 9ක් දිග ලී කණු 21000ක් හා මීටර් 10ක් දිග ලී කණු 3400ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලද බවත්;

(ii) අවම මිල ගණන් ඉදිරිපත් කළ රාජ්‍ය දැව සංස්ථාවේ ටෙන්ඩරය පිළිනොගත් බවත්;

(ii) දෙවනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කළ දකුණු අප්‍රිකානු සමාගමට ටෙන්ඩරය ප්‍රදානය කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත් මීටර් 9ක් දිග ලී කණු 10500ක් හා මීටර් 10ක් දිග ලී කණු 1700ක් මිලදී ගත් බවත්;

(ii) එයින් දකුණු පළාතට සැපයූ කණු 2363කින් පාවිච්චියට ගෙන තිබුනේ කණු 73ක් පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) රාජ්‍ය දැව සංස්ථාවට ඉහත ටෙන්ඩරය ප්‍රදානය නොකිරීම නිසා රුපියල් මිලියන 79.5ක පාඩුවක් සිදු වූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එකී පාඩුව පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0327/'10

12\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 සහ 2009 වර්ෂයන් තුළ, ශ්‍රී ලංකා රේගුව මගින් අත්අඩංගුවට ගන්නා ලද නීත්‍යානුකූල නොවන බඩු භාණ්ඩ වෙනුවෙන් අදාළ නිලධාරීන් වෙත ලබාදී ඇති ත්‍යාග සහ දීමනාවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(ii) එම ත්‍යාග සහ දීමනා ලබා ගත් නිලධාරීන් කවුරුන්ද;

(iii) අදාළ නිලධාරීන් වෙත ත්‍යාග සහ දීමනා ලබාදීමට හේතු වූ සිද්ධීන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරීන් වෙත ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0069/'10

13\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැනට මාස 08 ට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුකන්ද ග්‍රාම නිලධාරි වසමේ, කොලොන්ගහහේන මාර්ගයේ මීටර් 300 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0093/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ඇඟලුම් කර්මාන්තයට අයත් කර්මාන්තශාලා ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් කර්මාන්තශාලාව විවෘත කරන අවස්ථාවේ ඒවායෙහි සිටි සමස්ත ශ්‍රම බලකාය කොපමණද;

(iii) දැනට ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව සහ අද වන විට ඒවායෙහි වැඩ කරන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වසා දමා ඇති කර්මාන්තශාලා විවෘත කිරීම පිණිස යොදාගෙන ඇති ක්‍රියාකාරී සැළසුම් කවරේද;

(v) 2004 සිට 2010 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයෙහි අපනයනය කළ ඇඟලුම් ප්‍රමාණය සහ සමස්ත ඉපයීම්වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ශ්‍රී ලංකාවේ තිබෙන රෙදි නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව, ඒවායෙහි නිෂ්පාදන ධාරිතාව සහ වියන ලද හෝ ගොතන ලද වයනය අනුව රෙදි වර්ගයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0273/'10

15.

ගරු රාජීව විජේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "ඉන්ටර්නැෂනල් ක්‍රයිසීස් ගෘෘප්" නමැති සංවිධානයක් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සංවිධානයේ නියෝජිතයින් දැනට ශ්‍රී ලංකාව තුළ සිටිත් ද, එසේත් නැති නම්, පසු ගිය වර්ෂ 10ක කාලය තුළ සිටියෝ ද;

(ii) එම සංවිධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූයේ කවර විධිවිධාන යටතේද;

(iii) එහි ජාත්‍යන්තර ක්‍රියාකාරිකයින් සඳහා වීසා බලපත් ලබා දුන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මෙම සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුළ සේවයේ යොදවනු ලැබූ ශ්‍රී ලාංකිකයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සතු අධ්‍යාපනික හෝ වෙනත් සුදුසුකම් කවරේද;

(iii) "ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප්" සංවිධානය විසින් ඒ එක් එක් තැනැත්තාට ගෙවන ලද මුදල සහ ඒවා ගෙවූ පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම සංවිධානය හෝ එහි සේවකයින්ගෙන් කිසිවකු ශ්‍රී ලංකාවේදී බදු ගෙවිය යුතුව තිබේද;

(ii) එසේ නම්, ඔවුන් එම වගකීම ඉටු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— දහ අට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— පළාත් සභා (සංශෝධන),— 1987 අංක 42 දරන පළාත් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2010 සැප්තැම්බර් මස 08 වැනි බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2010.09.08 දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 7.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2010 අගෝස්තු මස 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

ජාතික සේවක අධ්‍යයන ආයතන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*3.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2010 අගෝස්තු මස 17) [1]

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

# 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*9.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---